**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**
**මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය**
**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව**

# ලංසු ආරාධනය

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත ලේඛන පරිලෝකන යන්ත්‍ර 22ක් සැපයීමේ, බෙදීමේ, ස්ථාපිත කිරීමේ, බලය පැවරීමේසහ නඩත්තු කිරීමේ ප්‍රසම්පාදනය**
**IFBඅංකය:DIE/PRO/04/2025/24**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් **ආගමන හා විගමන දෙපාර්තමේන්තුවවෙත ලේඛන පරිලෝකන යන්ත්‍ර 22ක් සැපයීමේ, බෙදීමේ, ස්ථාපිත කිරීමේ, නඩත්තු කිරීමේ සහබලය පැවරීමේප්‍රසම්පාදනය** සඳහායෝග්‍යතා පූර්ණ සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

1. මෙම ලංසුකරණය ජාතික තරඟකාරි ලංසුකරණ ක්‍රියා පටිපාටිය යටතේ පැවැත්වේ.
2. පිරිනැමුම් ලිපියේ සඳහන් දින සිට සති 2ක් ඇතුළත සියළු භාණ්ඩ බාර දිය යුතුවේ.
3. රුපියල් තුන් දහස් පන්සීයක (රු.3,500/-) ක ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් හා ලිඛිත අයදුම්පතක් බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාරේ, “සුහුරුපාය”, 05 වන මහලේ,ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ, ප්‍රසම්පාදන අංශයේ නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන)වෙත ඉදිරිපත් කිරීමෙන් පසු මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්හටඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් **23.07.2025 දින සිට 06.08.2025 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාල පරිච්ඡේදය** තුළදී මිල දී ගත හැක. ගෙවීම් කළ යුත්තේ මුදලිනි.
4. මේ පිළිබඳව උනන්දුවක් දක්වන යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්හට වැඩිමනත් විස්තර සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00දක්වා කාල පරිච්ඡේදය තුළ දී 0112 – 101559 දරන දුරකතන අංකය අමතා ලබා ගත හැක. **3 වැනි ඡේදයේ සඳහන් ව ඇති** ලිපිනයේ පිහිටි කාර්යාලයට පැමිණ හෝ දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වන **www.immigration.gov.lk** හරහා හෝ නොමිලේ ලංසු ලිපිලේඛන පරීක්ෂාව **23.07.2025 දින සිට 06.08.2025 දින දක්වා** සිදු කළ හැක.
5. නිසි ලෙස සම්පූර්ණ කරන ලද ලංසු,“මුල් පිටපත”(Original) හා “අනුපිටපත“ (Duplicate) ලෙස පිටපත් දෙකකින් යුතුව වෙන වෙනමම කවරවල බහා එම කවරඑකම කවරයක බහා මුද්‍රා තබාමෙම මුද්‍රා තැබූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ කොන්ත්‍රාත්කරුගේ නම සහ IFB අංකය සඳහන් කර පහත සඳහන් කර ඇති ලිපිනයට **07.08.2025** වැනි දින ප.ව. 2.00ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් ඒ සඳහා3 වැනි ඡේදයේ සඳහන් ලිපිනයේ තබා ඇතිටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ සිදු කළ යුතුය.භාරදෙනු ලබන ලංසුව ලංසු භාරගන්නා අවසාන දින සිට දින හැත්තෑ හතක් (77) දක්වා හෝ ගැනුම්කරු විසින් නියම කරනු ලබන ඕනෑම දිගුකරන කාල පරිච්ඡේදයක් සඳහා වලංගුභාවයෙන් යුක්ත විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු කැඳවීම අවසන් වූ වහාම, පැමිණීම සඳහා කැමැත්ත දක්වන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේදීඡේදයේ සඳහන් ලිපිනයේ දී ලංසු විවෘත කරනු ලැබේ.

**සභාපති,**
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
05 වැනි මහල,
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,
“සුහුරුපාය”,
ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.

**සභාපති,**
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
05 වැනි මහල,
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,
“සුහුරුපාය”,ශ්‍රී සුභූතිපුර පාර,බත්තරමුල්ල.